# බට්ටිගේ මල් වත්ත



W.M. අමන්දි ෂෙනාලියා වික්‍රමසිංහ

# බට්ටිගේ මල් වත්ත

කර්තෘ : W.M. අමන්දි ෂෙනාලියා වික්‍රමසිංහ

4 ශ්‍රේණිය

මහ/මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර

කර්තෘ ප්‍රකාශනයකි.

පළමු මුද්‍රණය : 2023

පිට කවරය : W.M. අමන්දි ෂෙනාලියා වික්‍රමසිංහ

ISBN Number : 978-624-206-828-2

# පිදුම

මාගේ ඉගෙනීම් කටයුතු නිසි

ඇයුරින් සිදු කර ගැනීමට

සහය දක්වන සමන්මලී

ගුරුමෑණියන්ට හා

ඉගෙනීමේ අගය පිළිබඳ

කියා දෙන මාගේ ආදරණීය

අම්මාට සහ අප්පච්චිට

සෙනෙහෙ සිතින් පුදමි !

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් “දිවිය දිනන විද්‍යුත් පොතක් “ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ “දිවිය දිනන විද්‍යුත් පොතක් “ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.
මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන්, සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර,

විදුහල්පතිනිය,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

2023 '11 ' 01

ඈත අතීතයේ එක්තරා ලස්සන ගම්මානයක පුංචි ලස්සන ගෙදරක ගොවි පවුලක් ජීවත් වුණා. එ ගෙදර සිටියේ අම්මායි, තාත්තායි, පුංචි ගැහැනු ළමයෙක්. ඒ ළමයාගේ නම පුංචි බට්ටි.



පුංචි බට්ටි පෙර පාසල් යන පුංචි ළමයෙක්. පුංචි බට්ටිට ලස්සන මල් වත්තක් තිබුණා. ඒ මල් වත්තේ එක එක මල් වර්ග වලින් පිරිලා. වද මල්, ඇන්තූරියම් මල්, කපුරු මල්, රෝස, කූඩලු, කටරොළු මල්, වැනි ලස්සන මල් වර්ග වලින් පිරී තිබුණා.



හැමදාම පුංචි බට්ටි පෙර පාසල් ගිහින් ඇවිත් මල් වත්ත බලන්න ගියා. ලස්සනට මල් පිපිලා සුවඳ හමනවා. පුංචි බට්ටි මල් සුවඳට හරිම කැමතියි.



දවසක් බට්ටි අම්මාත් එක්ක මල් වත්තට ගියා. බට්ටි යනකොට ලස්සන සමනලයෙක් මල් පැණි බොමින් සිටියා.

බට්ටි සමනලයාට කතා කළා “ලස්සන සමනලයෝ ඔයා මගේ මල් වල මල් පැණි බොනවද”?

සමනලයා බට්ටිට කියනවා “ඔව් ළමයෝ මම ඔයාගේ මල් වල පැණි බිව්වාට කමක් නැද්ද.”?



අනේ කමක් නැහැ, ඔයාගේ බඩ පුරවා ගන්න ලස්සන සමනලයෝ ඔයා මගේ මල් වත්තට ඇවිත් හැමදාම මල් පැණි බොන්න ඔයාට මම හරිම කැමතියි. දැන් බට්ටිගේ යාළුවා සමනලයා.



එක දවසක් බට්ටි අම්මාත් එක්ක මල් වත්තට ගියා. සමනලයෝ ගොඩක් ඇවිත් මල් පැණි බොනවා. බට්ටිට හරිම සතුටුයි.



“සමනලයෝ, අද ඔයාගේ යාළුවෝ ගොඩක් ඇවිත් මල් පැණි බොනවා නේද?, අනේ එයාලත් මාත් එක්ක ආවා කමක් නෑ නේද?

“අනේ කමක් නැහැ. මට හරිම සතුටුයි ඔයාලා හැමෝම එන්න මම තව මල් පැළ සිටුවන්නම්.”

සමනලයාට හරිම සතුටුයි “එහෙනම් අපි හැමදාම එන්නම් සමනලයා කිව්වා”.



බට්ටි නිවාඩු දවස් වලට මල් පැළ සිටුවනවා, වතුර දමනවා, පොහොර දමනවා, වැඩියෙන් මල් පිපෙන්න. එවිට සමනලයින්ට හැමදාම මල් පැණි බොන්න පුළුවන්. බට්ටි අම්මාත් සමඟ හැමදාම හවසට බට්ටිගේ මල් වත්තෙන් මල් වට්ටියක් කඩා ගෙන බුදු සාදුට පූජා කරනවා. ඉන් පසුව ඇය ප්‍රාර්ථනා කරනවා එයාගේ මල් වත්තේ වැඩියෙන් මල් පිපෙන්න කියලා සමනලයින්ට මල් පැණි බොන්න.



අනේ බට්ටි ඔයා ගැන අපට හරිම සතුටුයි. ඔයා හොඳ ගැහැනු ළමයෙක්. ඔයා අපි ගැන හිතලා අපිට මල් පැණි බොන්න මල් පැල සිටුවලා අපි ඒවාගේ මල් පැණි බිව්වාට ඔයාටත් සතුටුයි.



ඔයා වගේ කරුණාවන්ත ළමයි ඉන්නවානම් අපට නිදහසේ ජීවත් වෙනන් පුළුවන්. සමනලයා බට්ටිට කිව්වා.

බට්ටිටයි, අම්මාටයි හරිම සතුටුයි ඔයාලා අපේ මල් වත්තේ හැමදාම මල් පැණි බොන්න.



නිමි

# ස්තූතිය

මා හට හොඳ නරක කියා දෙමින්
ඉගෙනීමේ කටයුතු නිසි අයුරින්
කියා දෙන සමන්මලී ගුරු
මෑණියන්ට හා මා හට ඉගෙනීමේ
අගය කියා දෙන අම්මාට හා
අප්පච්චිට මාගේ හද පිරි
ස්තූතිය පුද කරමි !

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ, ආර්ථික, පරිවර්තනයන් හේතුකොට ගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක